# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරු සිසු අත්වැල

**(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)**

## Business Studies

**නිපුණතාවය**

**6.0 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික සංවර්ධනයට දක්වන දායකත්වය අගයයි.**

---

# සුළු හා මධ්‍ය පරිමාණ


**අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ**

**සම්පත් දායකත්වය : ඩී. ඒ. සජිත් එරංග වික්‍රමආරච්චි මහතා**
**ර/ මැද්දෙකන්ද මහා විද්‍යාලය**


**වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය**

## නිපුණතා මට්ටම 6.1 : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් ඒවායේ වැදගත්කම අගයයි.

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- පිළිගත් නිර්ණායක සලකා බලමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථ දක්වයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සුවිශේෂී ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් ලැබෙන දායකත්වය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ලැයිස්තුගත කරයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට හේතු විග්‍රහ කරයි.

### ඇමරිකා එක්සත් ජනපදයේ

### කුඩා ව්‍යාපාර පරිපාලන ආයතනයට අනුව සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් යනු

**( ඇමරිකා එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය**
**(Small Business Administration Institute - USA )**

ස්වාධීන ව අයිති හා ස්වාධීන ව ක්‍රියාත්මක වන එසේ ම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නො වූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල දැකිය හැකි පොදු ලක්ෂණ

1. කර්මාන්තය තුළ ඇති බලය සීමිත වීම.
2. අදාළ කර්මාන්තය තුළ ආධිපත්‍ය පැතිරිය නොහැකි වීම.
3. ස්වාධීන හිමිකාරිත්වයක් හා කළමනාකරණය බොහෝ විට හිමිකරු විසින්ම සිදු කිරීම.
4. සාපේක්ෂව කුඩා වෙළෙඳපොළ කොටසක් හිමිවීම.
5. සාපේක්ෂව ශ්‍රම සූක්ෂම වීම.
6. නවීන තාක්ෂණය අවම වශයෙන් යොදා ගැනීම.
7. දක්ෂ කළමනාකරණයක් දැකිය නොහැකි වීම.
8. ආයෝජිත ප්‍රාග්ධනය සීමිත වීම.
9. සේවක සංඛ්‍යාව අඩු වීම.
10. පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් යොදා ගැනීම.
11. වෙළඳපොළ බොහෝ විට දේශීය වීම.
12. තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු කිරීම.



**Questions**
**MCQ**

1. ස්වාධීනව අයිතිය හා ස්වාධීනව ක්‍රියාත්මක වන එසේම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ. මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ කවර ආයතනයක් විසින්ද?.

2012/ AL

..........................................................................................................

2. කුඩා ව්‍යාපාර යන්නෙන් වඩාත් හොඳින් අර්ථ දක්වෙන ප්‍රකාශය තෝරන්න. 2008/ AL
   1. තනි පුද්ගලයෙකු සතු ව්‍යාපාර
   2. ග්‍රාමීය ප්‍රදේශවල ස්ථාන ගත වී ඇති ව්‍යාපාර
   3. අදාළ කර්මාන්තය තුළ ආධිපත්‍ය පැතිරවිය නොහැකි ව්‍යාපාර
   4. ශ්‍රම සූක්ෂම ව්‍යාපාර
   5. නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර

3. සුලු ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වඩාත් සත්‍ය ප්‍රකාශය තෝරන්න. 2003/ AL
   1. ආයෝජනයට ප්‍රතිලාභ අඩු මට්ටමක පවතින ව්‍යාපාරය
   2. දක්ෂ කළමනාකරණයක් නොමැති ව්‍යාපාරය
   3. නවීන තාක්ෂණය සුලුවෙන් යොදාගෙන ඇති ව්‍යාපාරය
   4. කේවල ස්වාමි ව්‍යාපාර ගණයට අයත්වේ
   5. සාපේක්ෂව කුඩා වෙළඳපොළ කොටසක් හිමි ව්‍යාපාරය




**Home Work**

**Qestion**

1. කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා යොදා ගන්නා නිර්ණායක අනුව ඒවායේ දැකිය හැකි ගති ලක්ෂණ 4ක් සඳහන් කරන්න.

## කුඩා පරිමාණ ව්‍යාපාර මැන ගත හැකි නිර්ණායක

කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට පොදු නිර්ණායකයක් නොමැත. විවිධ ආයතන විවිධ නිර්ණායක භාවිතා කරයි. පොදු වේ මෙම නිර්ණායක ප්‍රධාන පදනම් දෙකකට වර්ග කළ හැකිය.

1. **ප්‍රමාණාත්මක නිර්ණායක/ සාධක**

   සංඛ්‍යාත්මක පදනමකින් ගණනය කළ හැකි නිර්ණායක ප්‍රමාණාත්මක නිර්ණායක ලෙස හඳුන්ව යි.

උදා:

1. සේවක සංඛ්‍යාව
2. ආයෝජිත ප්‍රාග්ධනය
3. ස්ථාවර වත්කම්වල වටිනාකම
4. වාර්ෂික පිරිවැටුම
5. විදුලිබල ධාරිතාව
6. නිෂ්පාදන ධාරිතාවය

2. **ගුණාත්මක නිර්ණායක/ සාධක**

සංඛ්‍යාත්මක පදනමකින් ගණනය කළ නොහැකි නිර්ණායක ගුණාත්මක නිර්ණායක ලෙස හඳුන්ව යි.

**උදා:**

1. ව්‍යාපායේ ස්වභාවය
2. භාවිතා කරන තාක්ෂණය
3. වෙළෙඳපොළ ස්වභාවය
4. නිමවුමේ ස්වරූපය
5. සේවකයන් සමීප ලෙස සුපරීක්ෂණය කිරීමේ හැකියාව
6. කළමනාකරණ ශිල්පීය ක්‍රම

## ශ්‍රී ලංකාවේ විවිධ ආයතන කුඩා ව්‍යාපාර වර්ග කරන ආකාරය

| ආයතනය | නිර්ණායකය |
|---|---|
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | යොදවා ඇති ප්‍රාග්ධනය රු.මි. 4 නොඉක්මවන ව්‍යාපාර |
| 2. කාර්මික තාක්ෂණික ආයතනය | යොදවා ඇති ප්‍රාග්ධනය රු.මි. 4 නොඉක්මවන ව්‍යාපාර |
| 3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | යොදවා ඇති ප්‍රාග්ධනය රු.මි. 4 නොඉක්මවන ව්‍යාපාර |
| 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය | ආයෝජිත ප්‍රාග්ධනය රු. මි. 20 නොඉක්මවන ව්‍යාපාර |
| 5. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යපාර |
| 6. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය | ස්ථිර සේක සංඛ්‍යාව 50ට අඩු ව්‍යාපාර |
| 7. ශ්‍රී ලංකා මහ බැංකුව | භාවිතා කරන විදුලි බල ධාරිතාවය කිලෝ වොට් ඇම්පියර් 50ට අඩු ව්‍යාපාර |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා මහා පරිමාණ ව්‍යාපාර**

**යනුවෙන් වර්ග කොට හඳුනා ගැනිමේ අවශ්‍යතාවය**

1. මූල්‍ය පහසුකම් / ණය සැපයීමට.
2. දළ දේශීය නිෂ්පාදිතයට ලබා දී ඇති දායකත්වය ගණනය කිරීමට.
3. රාජ්‍ය දිරිගැන්වීම්, ආධාර හා ප්‍රතිපාදන ලබා දීමට.
4. ජාත්‍යන්තර ආධාර ලබා දීමට.
5. බදු විරාම, බදු සහන ලබා ගැනීමට.
6. ව්‍යාපාර සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට.
7. සම්පත් බෙදී යාමේ විෂමතාව අවම කිරීමට.



**Questions**
**MCQ**

1. සුලු ව්‍යාපාරයක් මහා පරිමාණ ව්‍යාපාරවලින් වෙන්කර ගත හැකි වන්නේ, 2002/ AL

 1. සේවක සංඛ්‍යාව අනුවය. 2.පිරිවැටුම අනුවය.

 3. ආයෝජිත ප්‍රාග්ධනය අනුවය. 4.තාක්ෂණය අනුවය. 5.ඉහත සියල්ම අනුවය.

2. සුලු ව්‍යාපාරයක් හඳුනාගත හැකි වන්නේ, 2001/ AL

 1. ව්‍යාපාර සංවිධාන ක්‍රමය තුළින්ය.

 2. උපයන ලාභ ප්‍රමාණය තුළින්ය. 3. ව්‍යාපාරික අරමුණ අනුවය.

 4. වෙළඳපොලේ ස්වභාවය අනුවය. 5. ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය අනුවය.




**Home Work**
**Qestion**

1. (අ) කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට යොදා ගන්නා නිර්ණායක 4 ක් නම් කරන්න.

 (ආ) කුඩා ව්‍යාපාර සෙසු ව්‍යාපාරවලින් වෙන් කර හඳුනා ගැනීම අවශ්‍ය වන්නේ ඇයි?

2012/ AL old

## ආර්ථික සංවර්ධනයෙහිලා සුළු ව්‍යාපාරවල වැදගත්කම

1. රැකියා අවස්ථා ජනිත වීම.
2. ප්‍රාදේශිය සම්පත් භාවිතය.
3. ව්‍යවසායකත්ව සංවර්ධනය.
4. ආදායම් ව්‍යාප්ති විෂමතාවය අඩු කිරීම.
5. නිෂ්පාදිත විවිධාංගීකරණය.
6. මහා පරිමාණ ව්‍යාපාර නොසලකා ඇති ක්ෂේත්‍ර වර්ධනය.
7. දිළිඳුකම පිටු දැකීම.
8. නව නිෂ්පාදිත හඳුන්වා දීම.
9. විශේෂිත භාණ්ඩ හා සේවා සැපයීම. උදා: අත්කම්/ බුමුතුරුණු
10. නම්‍යශීලී බව.
11. දේශීය ව්‍යාපාර හිමිකාරිත්වය වර්ධනය.
12. සමාජ දායකත්වය.
13. ඵලදායීතාවය හා ලාභදායිත්වය වර්ධනය.
14. අපනයන ආදායම ඉහළ යාම.

## සුලු ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී හා පවත්වා ගෙන යාමේ දී සැලකිළිමත් විය යුතු කරුණු

1. තමා පිළිබඳ තම ව්‍යාපාරය පිළිබඳ තේරුම් ගැනීම.
2. මනා කළමනාකාරිත්වයක් පවත්වා ගැනීමට ඇති හැකියාව.
3. වෙළෙඳපොළ පිළිබඳ දැනුම ඇති අයෙකු වීම.
4. මූල්‍ය තත්ත්වය පිළිබඳ දැනුම.
5. ව්‍යාපාර සැලසුම් සකස් කිරීම.
6. ව්‍යාපාර පරිසරය සහ ප්‍රජාව පිළිබඳ මනා අවබෝධය.
7. ව්‍යාපාර උපදේශන ලබා ගැනීම.
8. රජයේ සහ වෙනත් ආයතනවල සහය ලබා ගැනීම.
9. ව්‍යවසායකයාගේ උනන්දුව හා කැපවීම.
10. ව්‍යාපාර කටයුතු සඳහා බලපාන නීතිමය දැනුම ලබා ගැනීම.

## සුළු ව්‍යාපාරයක් සාර්ථක වීමට බලපාන හේතු

- ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම.
- මූල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්.
- පුළුල් වෙළෙඳපොළක් පැවතීම.
- විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම.
- දක්ෂ කළමනාකරණයක් තිබීම.
- ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු

- මූල්‍ය ගැටලු.
- වෙළෙඳපොළ තරඟකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම.
- කළමනාකරණයේ දුර්වලතා.
- ව්‍යවසායකත්ව හැකියා අඩු වීම.
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම.
- නව තාක්ෂණික දැනුම අඩුකම හා නව තාක්ෂණය යොදා නො ගැනීම.

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල
# සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වන ආකාරය

- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වයට ව්‍යවසායකත්වය ඉවහල් වේ.
- ව්‍යාපාර ඇරඹීම අවදානම් සහගත වීම,

  එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එය අවම කර ගත හැකි ය.
- ව්‍යවසායකයා තුළ ඇති ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපායි.
- අවදානම්වලට සාර්ථකව මුහුණ දෙමින් නව කුඩා ව්‍යාපාර ඇරඹීමෙන් ව්‍යවසායකයන් කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායක වේ.
- ඕනෑම රටක ආර්ථික සංවර්ධනය කරන ප්‍රධාන බලවේගය කුඩා ව්‍යාපාරයි. කුඩා ව්‍යාපාර සංවර්ධනය කරන ප්‍රධාන බලවේගය ව්‍යාවසායකත්වයයි. ආර්ථික සංවර්ධනයේ යන්ත්‍රය කුඩා ව්‍යාපාර නම් එය ධාවනය කරන ඉන්ධනය වනුයේ ව්‍යවසායකත්වයයි.



**Questions**
**MCQ**

1. සුලු ව්‍යාපාරවල සාර්ථකත්වයේ ප්‍රාථමික උත්තේජනය වනුයේ …………………………….ය.

2. සුලු ව්‍යාපාර අසාර්ථක වීමට ප්‍රධානම හේතුව වන්නේ**,** 2006/ AL
   1. ප්‍රාග්ධන හිගය.
   2. පාලනය ප්‍රමාණවත් නොවීම.
   3. ව්‍යවසායකත්ව හුදකලා බව.
   4. සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවල දුර්වලතා .
   5. සැලසුම්කරණය ප්‍රමාණවත් නොවීම.

3. ශ්‍රී ලංකාවේ බොහොමයක් සුලු ව්‍යාපාර අසාර්ථක වීමට ප්‍රධාන හේතුව වන්නේ**,** 2003/ AL
   1. කළමනාකරණ නිපුනතා අඩු වීමයි.
   2. දුර්වල අලෙවිකරණයයි.
   3. නව තාක්ෂණයේ අභියෝගයයි.
   4. ස්ථාවර වත්කම්වල අධි ආයෝජනයයි.
   5. ඉහත සියල්ලම වේ.

4. සුලු ව්‍යාපාරවලට වෙළඳපොලේ සාර්ථකව රැඳී සිටිය හැකි වන්නේ**,** 2001/ AL
   1. මහා පරිමාණ ව්‍යාපාර ප්‍රවිෂ්ට නොවන ව්‍යාපාර කටයුතුවලට ප්‍රවිෂ්ට වීමෙනි.
   2. මහා පරිමාණ ව්‍යාපාර සතු වෙළඳපොලට ප්‍රවිෂ්ට වීමෙනි.
   3. ප්‍රචාරණ සහ අලෙවි ප්‍රවර්ධන ක්‍රම සුලබ කිරීමෙනි.
   4. විදේශ වෙළඳපොළට ප්‍රවිෂ්ට වීමෙනි.
   5. මහා පරිමාණ ව්‍යාපාර සමග තරග කිරීමෙනි.




**Home Work**

**Qestion**

1. සුලු ව්‍යාපාරයක් ආරම්භ කිරීම තුලින් ව්‍යවසායකයෙකුට ලබාගත හැකි ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න. 2000/ AL
2. මහා පරිමාණ ව්‍යාපාර කොතරම් පැවතුනද ඒ තුළ සුලු ව්‍යාපාර පවත්වාගෙන යනු දැකිය හැකිය. හේතු දක්වන්න. 2001/ AL
3. ශ්‍රී ලංකාවේ සුලු ව්‍යාපාර ආරම්භකර සුලු කාලයකින් වැසීයනු දැකිය හැකිය. මෙයට හේතු මොනවාද? 2007/ AL
4. පුද්ගලයෙක් සුලු ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ඔහු සලකා බැලිය යුතු සාධක කවරේ ද? 2002/ AL

## නිපුණතා මට්ටම 6.2 : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති දිරිගැන්වීම් සොයා බලයි.

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :**

- සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරයි.
- රජය ලබා දෙන දිරි ගැන්වීම් මූල්‍යමය හා මූල්‍යමය නො වන වශයෙන් වර්ග කර දක්වයි.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම් වගු ගත කරයි.
- තෝරා ගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ඊට ලබා දී ඇති දිරිගැන්වීම් හඳුනා ගෙන ඒවා මූල්‍යමය හා මූල්‍යමය නො වන ලෙස වර්ග කරයි.
- සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට දිරි ගැන්වීම් ලබා දෙන වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ලැයිස්තුගත කරයි.
- තෝරා ගත් ව්‍යාපාරයකට දිරි ගැන්වීම් ලබා දෙන ව්‍යාපෘති හා ඒවා මගින් ලබා දෙන දිරිගැන්වීම් වගු ගත කරයි.

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දිරිගැන්වීම්

ව්‍යාපාර ආරම්භ කිරීමට මෙන්ම පවත්වා ගෙන යාම සඳහා ලබා දෙන උපකාර දිරිගැන්වීම් ලෙස හඳුන්වයි.

| මූල්‍යමය දිරිගැන්වීම් | මූල්‍යමය නොවන දිරිගැන්වීම් |
|---|---|
| 1. බැංකු ණය පහසුකම් | 1. උපදේශන සේවා |
| 2. විශේෂ ණය යෝජනා ක්‍රම | 2. පුහුණු හා සංවර්ධන සේවා |
| 3. කල්බදු පහසුකම් | 3. යටිතල පහසුකම් |
| 4. අයිරා පහසුකම් | 4. වෙළඳපොල පහසුකම් |
| 5. මූල්‍යමය ආධාර | 5. තාක්ෂණික පහසුකම් |
| 6. බදු සහන හා බදු ප්‍රතිදාන | 6. ත්‍යාග හා සම්මාන පිරිනැමීම |
| 7. ප්‍රතිමූල්‍ය පහසුකම් | 7. ප්‍රමිති හා තත්ත්ව පාලන සේවා |
| 8. පොලී සහනාධාර | 8. නීති උපදෙස් සේවා |
| 9. ණය සඳහා ඇප ආවරණ | 9. ව්‍යාපාර සැලසුම් හා ව්‍යාපෘති වාර්තා සකස් කර දීම. |
| | 10. ගිණුම්කරණ හා බදු උපදේශන සේවා |

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දිරිගැන්වීම් ලබාදෙන ආයතන

### 1. රාජ්‍ය ආයතන

- කාර්මික සංවර්ධන මණ්ඩලය
- අපනයන සංවර්ධන මණ්ඩලය
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
- ජාතික සංවර්ධන බැංකුව
- කාර්මික තාක්ෂණ ආයතනය

### 2. වෙනත් ආයතන

- සර්වෝදය
- ජයිකා (ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය )
- බදු වාර්තා සකස් කර දෙන පෞද්ගලික ආයතන
- සණස (සකසුරුවම් හා ණය දෙන සමිති )
- පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන

## කුඩා පරිමාණ සඳහා විවිධ ආයතන මගින් සපයා ඇති විවිධ පහසුකම්

1. උපදේශන සේවා
2. තාක්ෂණික පහසුකම්
3. මූල්‍ය පහසුකම්
4. වෙළඳපොළ පහසුකම්
5. යටිතල පහසුකම්

## උපදේශන සේවා පහසුකම් සපයන ආයතන

1. කාර්මික සංවර්ධන මණ්ඩලය
2. අපනයන සංවර්ධන මණ්ඩලය
3. ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය
4. ශ්‍රී ලංකා ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානය
5. ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය

## තාක්ෂණික සේවා සපයන ආයතන

1. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
2. ජාතික ඉංජිනේරු පර්යේෂණ ආයතනය
3. කාර්මික තාක්ෂණ ආයතනය
4. ජාතික මෝස්තර මධ්‍යස්ථානය
5. කාර්මික සංවර්ධන මණ්ඩලය

## මූල්‍ය පහසුකම් සපයන ආයතන

1. ව්‍යවසායකත්ව ප්‍රාග්ධන සමාගම්
2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව බැංකුව (SME Bank)
3. ජාතික සංවර්ධන බැංකුව
4. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව
5. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

## වෙළඳපොළ සපයන ආයතන

1. හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල)
2. කාර්මික සංවර්ධන මණ්ඩලය (ලක් නිපැයුම්)
3. අපනයන සංවර්ධන මණ්ඩලය ( විදේශ වෙළෙඳපොළ)
4. මහවැලි සංවර්ධන අධිකාරිය.

## යටිතල පහසුකම් ලබාදෙන ආයතන

1. ලංකා අයෝජන මණ්ඩලය
2. කාර්මික සංවර්ධන මණ්ඩලය
3. සීමාසහිත යටිතල පහසුකම් සමාගම
4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය
5. නාගරික සංවර්ධන අධිකාරිය

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබා දෙන ආයතන හා ඒවායින් ලබා දෙන දිරිගැන්වීම්

| ආයතනය | ලබා දෙන දිරි ගැන්වීම් |
|---|---|
| 1. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA ) | මූල්‍යමය පහසුකම් ලබා දීම.<br>ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| 2. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව මණ්ඩලය | විදේශ වෙළෙඳපොළ පහසුකම් සපයා දීම. |
| 3. කාර්මික සංවර්ධන මණ්ඩලය | උපදේශන සේවා.<br>තාක්ෂණික දැනුම ලබා දීම.<br>යටිතල පහසුකම්. |
| 4. අපනයන සංවර්ධන මණ්ඩලය | අලෙවි පහසුකම්<br>උපදේශන සේවා |
| 5. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | උපදේශන සේවා |
| 6. ජාතික සංවර්ධන බැංකුව | මූල්‍ය පහසුකම් ලබා දීම. |
| 7. කාර්මික තාක්ෂණ ආයතනය | තාක්ෂණික දැනුම ලබා දීම.<br>උපදේශන සේවා සැපයීම. |
| 8. ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය (SLCSMI) | මූල්‍ය පහසුකම්.<br>විශිෂ්ටතා සම්මාන ලබා දීම. |



**Questions**
**MCQ**

1. කුඩා ව්‍යවසායකයින්ට මූල්‍ය පහසුකම් සැපයීම සඳහා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශයේ අනුග්‍රහයෙන් පිහිටුවා ඇති බංකුව කුමක්ද? 2009 AL ……….…………………………………

2. කුඩා ව්‍යාපාරවලට මූල්‍ය පහසුකම් සැපයීමේ මූලික අරමුණින් පිහිටුවා ඇති රාජ්‍ය බැංකුව කුමක්ද? 2009 AL ...……………………………………….……………….………………

3. ශ්‍රී ලංකාවේ සුලු ව්‍යාපාර සඳහා අවශ්‍ය ශිල්පීය දැනුම ලබා දෙන ආයතනයකි. 2003 AL

   1. DFCC බැංකුව
   2. කාර්මික සංවර්ධන මණ්ඩලය
   3. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
   4. සණස බැංකුව
   5. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

4. සුලු ව්‍යාපාර සඳහා අවශ්‍ය අරමුදල් ලබා ගැනීමට යෝග්‍ය මාර්ගය වන්නේ, 2002 AL

   1. මූල්‍ය සමාගම් ය.
   2. ප්‍රාග්ධන ව්‍යවසාය සමාගම් ය.
   3. කොටස් වෙළඳපොල ය.
   4. ඒකකභාර ය.
   5. ව්‍යාපාර බැංකු ය.

5. ශ්‍රී ලංකාවේ සුලු ව්‍යාපාර සංවර්ධනය සඳහා සෘජුව සම්බන්ධ වන ආයතනයක් නොවන්නේ, 2001 AL

   1. කාර්මික සංවර්ධන මණ්ඩලය
   2. කාර්මික තාක්ෂණ ආයතනය
   3. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය
   4. ස්මෙඩ් ආයතනය (SMED)
   5. ශ්‍රී ලංකා මෝස්තර මධ්‍යස්ථානය




**Home Work**
**Qestion**

1. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයන්ට තාක්ෂණික දැනුම ලබාගත හැකි ආයතන තුනක් නම්කර එම සේවාව ලබාදෙන ආකාරය කෙටියෙන් පැහැදිළි කරන්න. 2004/ AL

2. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට පිවිසෙන නව ව්‍යාපාරිකයින්ට පහත දැක්වෙන ආයතනවලින් ලබා ගත හැකි සේවාවන් නම් කරන්න. 2006/ AL old

   1. කාර්මික තාක්ෂණික ආයතනය
   2. කාර්මික සංවර්ධන මණ්ඩලය
   3. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර සඳහා ආධාර ලබා දෙන ව්‍යාපෘති

කුඩා ව්‍යාපාර සඳහා විවිධ සහනදායී ව්‍යාපෘති මගින් මූල්‍ය පහසුකම් සැපයේ. මේ අනුව පොලී අනුපාතිකය අඩු කිරීම, ණය ආපසු ගෙවීමට ලබා දෙන කාලය වැඩි කිරීම, ඇප සුරැකුම් ලිහිල් කිරීම ආදිය සිදු කරයි. මෙම ව්‍යාපෘති කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වයට මහඟු දායකත්වයක් ලබා දේ.

**1. කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (ලිය ඉසුර)**

කාරක ප්‍රාග්ධන සහාය සැපයීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු හරහා ක්‍රියාත්මක කරයි. කාන්තා ක්ෂුද්‍ර ව්‍යවසාය ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය කි.

**2. කුඩා කර්මාන්ත නායකත්ව සහ ප්‍රවර්ධන වැඩ සටහන (සුවන/ ස්මයිල් ) (SMILE)**

මෙය SMILE (Small & Micro Industries Leader & Entrepreneur promotion project ) ලෙස ද හඳුන්වයි.

අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රාහකත්වයෙන්, ජාතික සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් සපයමින් සුළු කර්මාන්ත ව්‍යවසායකයින් නංවාලමී සඳහා ක්‍රියාත්මක වන යෝජනා ක්‍රමය කි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියර ය.

**3. සහන්යා**

සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයකි. මේ සඳහා DFCC බැංකුව හා අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත.

**4. සණස ණය ව්‍යාපෘතිය**

කෘෂි, සත්ත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපයන යෝජනා ක්‍රමයකි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

## 5. සමුපකාර ග්‍රාමීය බැංකු ණය

කෘෂි, ධීවර, සත්ව පාලනය, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම මෙමගින් සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ. මේ සඳහා විවිධ සේවා සමුපකාර සමිති හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දෙයි.

## 6. සමෘද්ධි/දිවිනැගුම සංවර්ධන ණය යෝජනා ක්‍රමය

සමෘද්ධිය/දිවිනැගුම බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණය දීම හා අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රධානයන්ගෙන් හා සාමාජිකයින්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි. මෙහි පාලනය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. (සමෘද්ධි/දිවිනැගුම බැංකු ප්‍රාදේශීය සංවර්ධන බැංකු සමග ඒකාබද්ධ කරනු ලබන බව රජය නිවේදනය කර ඇත )

## 7. ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය

(කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යංශය යටතේ ඇති ) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා ගොවීන්ට කෙටි කාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.

## 8. දිළිඳුකම පිටු දැකීම සඳහා වන සුක්ෂම මුල්‍ය ව්‍යාපෘතිය (PAMP)

අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වු ජපන් බැංකුවේ හා රජයේ දායකත්වය මත දිළිඳුකම පිටුදැකීම සඳහා ආධාර කිරීමේ ව්‍යාපෘතියකි.

## 9. සිඩ්ස් (Seeds) ණය යෝජනා ක්‍රමය

සුළු පරිමාණ ව්‍යවසායකයින්ට සර්වෝදය බැංකු හරහා ණය ලබා දීමේ කටයුතු මේ යටතේ සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල් හා සාමාජික තැන්පත් මේ සඳහා යොදා ගනී. සීමාසහිත සීඩ්ස් ගැරන්ටි සමාගම පරිපාලන කටයුතු සිදු කරයි.

**10. දිරිය ණය යෝජනා ක්‍රමය**

මෙම ණය යෝජනා ක්‍රමය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය එක්ව ක්‍රියාත්මක කරයි. කෘෂි කාර්මික අංශය, සංචාරක කර්මාන්තය හා මැණික් කර්මාන්තය යන ක්ෂේත්‍රයන් හි නියුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට යන්ත්‍රෝපකරණ මිලට ගැනීම, කම්හල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය සැපයීම සිදුවේ.

**11. සෞභාග්‍යතා ණය යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආපදාවලින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ඇරඹීම හෝ වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රමයකි.

**12. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධකයෝ ව්‍යාපෘති හෙවත් ස්මෙඩ් - SMED**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම, රැකියා අවස්ථා ඇති කිරීම, අපනයන සංවර්ධනය තුළින් විදේශ විනිමය ඉපයීම, රට පුරා කර්මාන්ත ව්‍යාප්ත කිරීම ආදි අරමුණු ඉටු කර ගැනිම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ආයතන දෙක ඒකාබද්ධව කටයුතු කරයි.

- ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල නීතිගත සම්මේලනය
- ජර්මනියේ පෙඩ්රික් නිවුමන් පදනම



**Questions**
**MCQ**

1. අන්තර්ජාතික සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුවේ (JBIC) මූල්‍ය අනුග්‍රහය යටතේ ජාතික සංවර්ධන බැංකුව (NDB) විසින් ප්‍රතිමූල්‍ය සපයන වැඩසටහන හඳුන්වනුයේ..............................................යනුවෙනි. 2004 AL
2. SMED යන කෙටි නමින් හැඳින්වෙන ව්‍යාපෘතියේ නම කුමක්ද?...................... 2006 AL
3. සුවන(SMIlE) ව්‍යාපෘතිය සඳහා මූල්‍ය අනුග්‍රහය දරනු ලබන්නේ.................විසිනි. 2009 AL